# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2023/33 - 2017 ජූනි මස 14 වැනි බදාදා - 2017.06.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/78(xv)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27(1) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මෙම නියමය මගින්, (2017 පෙබරවාරි මස 08 වැනි දින අංක 2005/13 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය මගින් අවසන්වරට සංශෝධිත) එකී පනතේ 139 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාර එහි 21 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලබන, ශ්‍රී ලංකාවේ කැළණිය විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දක්වමින්, 2006 ජූලි 22 වැනි දින අංක 1454/37 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ උපලේඛනයේ I වන තීරයේ දක්වෙන ''සමාජ විද්‍යා පීඨය'' යන සටහනට අනුරූප වන්නා වූ උපලේඛනයේ II වන තීරයේ දක්වෙන ''9. ක්‍රීඩා විද්‍යා හා ශාරීරික අධ්‍යාපන අධ්‍යයන අංශය'' යන අයිතමයට ඉක්බිතිවම පහත දක්වෙන අලුත් අයිතම ඇතුළත් කිරීමෙන් එකී නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

''10. ජාත්‍යන්තර අධ්‍යයන අධ්‍යයන අංශය
11. සමාජ සංඛ්‍යාන අධ්‍යයන අංශය
12. දේශපාලන විද්‍යා අධ්‍යයන අංශය''.

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2017 ජූනි මස 12 වැනි දින,
කොළඹ දී ය.

06-1024